# අතුරලිය ප්‍රාදේශීය සභාව සඳහා ද්විත්ව රෝද සහිත කසල ප්‍රවාහනයට සුදුසු ට්‍රේලරයක් මිල දී ගැනීම.

**ලංසු අංකය - ATPS/D-1/PSDG/SW**

සේවාදායකයා:

සභාපති,

අතුරලිය ප්‍රාදේශීය සභාව,

අතුරලිය.

සැපයුම්කරු:

......................................

......................................

......................................

# පටුන

පටුන ........................................................................................................................................................... 2

I වන කොටස. ලංසු කරුවන්ට උපදෙස් (ITB) ............................................................................................................. 3

II වන කොටස: දත්ත පත්‍රිකාව ........................................................................................................................ 6

III වන කොටස - ලංසු කරු සතු අත්දැකීම ........................................................................................................ 6

IV වන කොටස - මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය..................................................................................... 7

V කොටස: පිරිවිතර අවශ්‍යතාව ........................................................................................................................ 8

VI කොටස: සපයන පිරිවිතර .......................................................................................................................... 9

VII කොටස: මිල ගණන් ලේඛනය (ශ්‍රී ලංකා රුපියල්) ....................................................................................... 11

VIII කොටස: සැපයීමේ කාල රාමුව 12

# I වන කොටස. ලංසු කරුවන්ට උපදෙස් (ITB)

| | |
|---|---|
| **A: සාමාන්‍ය** | |
| 1. ලංසු විෂය පථය | දත්ත පත්‍රිකාවේ නම් කර ඇති ගැනුම්කරු, පිරිවිතර උප ලේඛනයේ දක්වා ඇති අවශ්‍යතාවට අදාළ පරිදි කාර්ය හෝ සැපයුම් සිදු කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනා කරයි. මෙම ආරාධනය ලැබීමෙන් පසු, මෙම ආරාධනය ලැබීම සහ ලංසු ඉදිරිපත් කිරීමට ඔබ අදහස් නො කරන්නේ නම් ඒ බව හැකි ඉක්මනින් එය පිළිබඳ ව මිල ගණන් කැඳවන පාර්ශවය වෙත දැනුම් දීමට කාරුණික වන්න. |
| **B: ලේඛනවල අන්තර්ගතය** | |
| 2. මිල ගණන් කැඳවීමේ මෙම ලේඛනවල අන්තර්ගතය | පහත සඳහන් කොටස් වලින් ලේඛන සමන්විත වේ.<br>I වන කොටස: ලංසු කරුවන්ට උපදෙස් (ITB)<br>II කොටස: දත්ත පත්‍රිකාව<br>III කොටස: පසු ගිය වසර 5 තුල ඉටු කරන ලද මේ හා සමාන සැපයුම් කාර්යය ලැයිස්තු ගත කිරීම<br>IV කොටස: මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය<br>V කොටස: පිරිවිතර අවශ්‍යතාව<br>VI කොටස: සපයන පිරිවිතර<br>VII කොටස. මිල උප ලේඛනය (Bill of quantities)<br>VIII කොටස: සැපයීමේ කාල රාමුව |
| **C: මිල කැඳවීම සකස් කිරීම** | |
| 3. ඔබේ මිල කැඳවීම ඇතුළත් විය යුතු ලේඛන | මිල ගණන් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:<br>(අ) මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය<br>(ආ) මිල උප ලේඛනය (Bill of quantities) |
| 4. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය සහ මිල උප ලේඛනය | 4.1 මෙම ලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍ර හා මිල උප ලේඛනය, භාවිතා කර මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය. මෙම ආකෘති පත්‍ර එහි ආකෘතියට කිසිදු වෙනස් කිරීමකින් තොර ව සම්පූර්ණ කළ යුතු අතර ආදේශක භාර නො ගනී. ඉල්ලා ඇති සියලු ම තොරතුරු සම්පූර්ණ කර තිබිය යුතු ය.<br>4.2 විකල්ප ලංසු සලකා බලනු නො ලැබේ. එක ම අයිතමය සඳහා විවිධ විකල්ප ඉදිරිපත් නො කර, ලංසු කරුට ලබා දිය හැකි විකල්ප ලංසු අතරින් වඩාත් ම තරගකාරී විකල්පය සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. |
| 5. මිල ගණන් සහ වට්ටම් | 5.1 දත්ත පත්‍රිකාවේ නිශ්චිතව දක්වා නොමැති නම්, සියලු අයිතම මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.<br>5.2 මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු මිල, ඉදිරිපත් කරන ලද වට්ටම් ද අඩු කිරීමෙන් පසුව වන මිල ගණන් වල මුළු මිල විය යුතු ය.<br>5.3 වැට් බදු අදාළ වේ නම්, මිල ලේඛනයේ අදාළ ස්ථානයෙහි වෙන වෙනම දැක්විය යුතු ය.<br>5.4 ලංසු කරු ඉදිරිපත් කරන මිල ගණන් කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අතරතුර කිසිදු විචල්‍යතාවකට යටත් නො විය යුතු ය. වෙනස් කළ හැකි මිලක් සමඟ ඉදිරිපත් කරන ලද මිල කැඳවීමක් සාරානුකූලව ප්‍රතිචාර නො දක්වන ලංසුවක් ලෙස සලකනු ලබන අතර එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.<br>5.5 ට්‍රේලරයේ වැසි අංකයක් තිබිය යුතු අතර, රථය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර, ලියාපදිංචි ලේඛනය සහ අංක තහඩු ලබා දීම සඳහා වන මිල ගණන මිල ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.<br>5.6 සපයන භාණ්ඩ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය වෙත ප්‍රවාහනය කර භාර දිය යුතු ය. ඒ සඳහා වැය වන ප්‍රවාහන වියදමක් වේ නම්, මිල ලේඛනයේ අදාළ ස්ථානයේ සඳහන් කළ යුතු ය. |
| 6. මුදල් | මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි. |
| 7. භාණ්ඩවල අනුකූලත්වයට අදාළ ලියකියවිලි | මෙම ලේඛනයේ දක්වා ඇති තාක්ෂණික පිරිවිතර වලට හා ප්‍රමිතියට අනුකූලව ඉදිරිපත් කළ යුතු ය. ලංසු කරු විසින් පිරවිය යුතු පිරිවිතර පත්‍රිකාවේ ප්‍රමාණවත් තොරතුරු සඳහන් කළ යුතු ය. නිර්මාණ ඇඳීම් සහ නිෂ්පාදක විසින් නිකුත් කර ඇති පිරිවිතර පත්‍රිකා අමුණන්න. |
| 8. ලංසු වල වලංගු කාලය | මිල ගණන් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට පසු දින අනූවක් (90) සඳහා මිල ගණන් වලංගු විය යුතු ය. |

1

| | |
|---|---|
| 9. ආකෘති හා මිල ගණන් අත්සන් කිරීම | මිල ගණන් පරිගණක / යතුරුලියනය කර හෝ නො මැකෙන තීන්තවලින් සටහන් කළ යුතු අතර ලංසු කරු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි බලය ඇති පුද්ගලයෙකු විසින් අත්සන් කළ යුතු ය. |
| **D: මිල ගණන් ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම** | |
| 10. ලංසු ඉදිරිපත් කිරීම | 10.1 ලංසු මිල ගණන් බහා ලන කවරයේ ඉහල වම් කෙළවර "ට්‍රේලර සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කළ යුතු ය.<br>10.2 මිල ගණන් මුද්‍රා තබන ලද ලියුම් කවරවල බහා, තැපැල් මගින් හෝ අතින් ගැනුම්කරු වෙත යොමු කළ යුතු ය.<br>10.3 ලංසු ලේඛන මුද්‍රා තබා අවශ්‍යා පරිදි සලකුණු කර නොමැති නම්, අස්ථානගත වීම හෝ කලින් විවෘත කිරීම සම්බන්ධයෙන් ගැනුම්කරු කිසිදු වගකීමක් භාර නො ගනී. |
| 11. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය | "දත්ත පත්‍රිකාව" හි දක්වා ඇති ලිපිනයට ලැබිය යුතු අතර දත්ත පත්‍රිකාවේ දක්වා ඇති දිනය හා වේලාවට පෙර ඉදිරිපත් කල යුතු ය. |
| 12. ප්‍රමාද වී ලැබෙන ලංසු | ලංසු කරුවන්ට උපදෙස් හි 11.1 හි සඳහන් දිනට හා වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 13. ලංසු විවෘත කිරීම | 13.1 දත්ත පත්‍රිකාවේ දක්වා ඇති ලිපිනයේ දී එහි සඳහන් දිනය සහ වේලාවට ප්‍රසිද්ධියේ මිල ගණන් විවෘත කරනු ලැබේ.<br>13.2 ලංසු කරුවන්ගේ නියෝජිතයෙකුට එම අවස්ථාව සඳහා සහභාගි විය හැකි ය. |
| **E: මිල ගණන් ඇගයීම හා සංසන්දනය කිරීම** | |
| 14. පැහැදිලි කිරීම | 14.1 මිල ගණන් පරික්ෂා කිරීම, ඇගයීම සහ සංසන්දනය කිරීමට සහාය වීම සඳහා, ගැනුම් කරුට තම අභිමතය පරිදි ඕනෑම ලංසු කරුවකුගෙන් එහි මිල ගණන් පිළිබඳ පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිය හැකි ය. ගැනුම් කරුගේ ඉල්ලීමක් නොමැතිව ලංසු කරුවන් විසින් එහි මිල ගණන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ඕනෑම පැහැදිලි කිරීමක් සලකා බලනු නො ලැබේ.<br>14.2 පැහැදිලි කිරීම සඳහා වන ඉල්ලීම සහ ඒ සඳහා ප්‍රතිචාරය ලිඛිත ව විය යුතු ය. |
| 15. ලංසු වල වගකීම | 15.1 ලැබුණු මිල ගණන් වල අන්තර්ගතය මත පදනම් ව ලංසු කරු විසින් මිල ගණන් වලට දක්වා ඇති ප්‍රතිචාරාත්මක භාවය පිළිබඳ ගැනුම්කරු විසින් තීරණය කරනු ලැබේ.<br>15.2 නිකුත් කරන ලද ලියකියවිලි වලට සැලකිය යුතු ලෙස ප්‍රතිචාර නො දක්වන ලංසු ලෙස නිර්ණය කළ හැකි ලංසු ගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 16. ලංසු ඇගයීම | 16.1 ගැනුම්කරු විසින් සෑම ලංසුවක් ම සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති බව පරික්ෂා කරනු ලැබේ.<br>16.2 ලංසු ඇගයීමේ දී, පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ:<br>(අ) ලංසුවේ මිල;<br>(ආ) අංක ගණිතමය දෝෂ නිවැරදි කිරීම සඳහා මිල ගැලපුම;<br>(ඇ) පිරිනමන වට්ටම් හේතුවෙන් මිල වෙනස් වීම.<br>16.3 මිල ගණන් ඇගයීමේ දී මිල ගණන් වලට අමතරව දත්ත පත්‍රිකාවේ දක්වා ඇති වෙනත් සාධක සලකා බලනු ලැබේ. මෙම සාධක භාණ්ඩ මිල දී ගැනීමේ ලක්ෂණ (පිරිවිතර), කාර්යසාධනය, නියමයෙන් හා කොන්දේසි මත පදනම් විය හැකි ය. |
| 17. ඕනෑම මිල කැඳවීමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ගැනුම් කරුට ඇති අයිතිය | ලංසු පිරිනැමීමට පෙර ඕනෑම මිල කැඳවීමක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට, සම්පූර්ණ ක්‍රියාවලිය අවලංගු කිරීමට, හෝ ඕනෑම වේලාවක සියලු මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට ගැනුම් කරුට අයිතියක් ඇත. |
| **F: කොන්ත්‍රාත්තු ප්‍රදානය** | |
| 18. මිල ගණන් පිළිගැනීම | 18.1 අඩු ම තක්සේරු කරන ලද ලංසුවක් ලෙස තීරණය කර ඇති සහ නිකුත් කරන ලද ලියකියවිලි වලට සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන ලංසු කරුගේ මිල ගණන් ගැනුම්කරු භාර ගනු ඇත. |
| 19. ලංසුව පිළිගැනීමේ දැනුම්දීම | 19.1 ලංසුවේ වලංගු කාලය ඉකුත්වීමට පෙර, සාර්ථක ලංසු කරුට ලංසුව පිළිගත් බවට ලිඛිත ව දැනුම් දෙනු ඇත. |
| **G: ගෙවීම** | |

2

| | |
|---|---|
| 20. අත්තිකාරම් | සම්පූර්ණ කොන්ත්‍රාත්තු වටිනාකමින් 20% දක්වා වන මුදලකට සමාන වන බැංකු ඇපකරයක් ලබා දීම මත, එම බැංකු ඇපකරයේ මුදලට සමාන මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා ගත හැකි ය. බැංකු ඇපකරයේ වලංගු කාලය ඉකුත් වීමට පෙර එම අත්තිකාරම් මුදල බිල්පත් ගෙවීම් වලින් අඩු කිරීමට හෝ බැංකු ඇපකරය සඳහා මුදල් ලබාගැනීමට කටයුතු කරනු ඇත. |
| 21. බිල්පත් ගෙවීම | කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසු කොන්ත්‍රාත්තු මුදලින් 90% ගෙවනු ඇත. |
| 22. රැඳවුම් මුදල් | කොන්ත්‍රාත්තු මුදලින් 10% ප්‍රමාණයක් රඳවා ගන්නා අතර කාර්යය නිම කිරීමේ දින සිට දින 120කට පසු එම මුදල නිදහස් කරනු ඇත. |
| 23. ඇවර කරන ලද හානි (ප්‍රමාද අලාභ අය කර ගැනීම) | සැපයුම් කාල රාමුවෙහි නිශ්චිතව දක්වා ඇති, සැපයුම්කරු එකඟ වී ඇති කාල සීමාව තුළ එම වැඩ හෝ අදාළ සේවා කිසිවක් හෝ සියල්ල ඉටු කිරීමට අපොහොසත් වුවහොත්, ගැනුම් කරුට කොන්ත්‍රාත්තුව යටතේ ඇති අනෙකුත් සියලු පිළියම් වලට අගතියකින් තොර ව, ඇවර කරන ලද හානි ලෙස සතියකට කොන්ත්‍රාත්තු මිලෙන් 1%ක මුදලක් අඩු කරනු ලැබේ. එලෙස අඩු කළ හැකි ප්‍රමාද අලාභ ප්‍රමාණයේ උපරිමය කොන්ත්‍රාත්තු වටිනාකමින් 10% දක්වා වේ. |
| H: වෙනත් | |
| 24. වගකීම් කාලය | 24.2 ට්‍රේලය, ටයර, හෝස්, රෝද බෙයාරිං ඇතුළු රථයේ අනෙකුත් සියලු කොටස් සඳහා වසර දෙකක වගකීම් කාලයක් ලබා දිය යුතු ය.<br>24.3 සාමාන්‍ය ගෙවීම හෝ අනතුරකින් සිදු වන හානි හැර අනෙකුත් සියලු නිෂ්පාදන දෝෂ, පැස්සීම් දෝෂ, සහ අව් රශ්මිය, බර, හෝ කම්පනය හේතුවෙන් සිදු වන කැඩීම්, ඇද වීම්, ඉරි තැලීම්, යාන්ත්‍රික දෝෂ, පින්තාරුව ගැලවීම, ආදිය මෙම වගකීමෙන් ආවරණය විය යුතු ය.<br>24.4 වගකීමට අදාළ අලුත්වැඩියා සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවනු නො ලැබේ.<br>24.5 වගකීමට යටත් නොවන උපාංග වේ නම්, ඒවා සවිස්තරව සඳහන් කළ යුතු ය. |
| 25. සැපයුම්කරු නිෂ්පාදක ගේ බලයලත් අලෙවි හා සේවා නියෝජිතයකු වීම. | සැපයුම්කරු භාණ්ඩ නිෂ්පාදක ගේ බලයලත් අලෙවි සහ සේවා නියෝජිතයකු විය යුතු ය. එය සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය. |
| 26. අමතර කොටස් සැපයීමට සහ අලුත්වැඩියා සිදු කිරීමට සැපයුම්කරු ට ඇති හැකියාව. | මිල ගණන් ඉදිරිපත් කරන භාණ්ඩය සඳහා ඉදිරි වසර දහයක කාලය තුළ අමතර කොටස් සැපයීමට අවශ්‍ය අලුත්වැඩියා සිදු කිරීමට හැකියාව ඇති බවට සැපයුම්කරු එකඟ විය යුතු ය. එම එකඟතාව සඳහන් කර ලිපියක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය. |
| 27. අවශ්‍ය කාලය | ඇණවුම නිකුත් කළ දින සිට සැපයීම සිදු කර, සවි කිරීම් හා අදාළ වැඩ අවසන් කර, භාර දීම සඳහා සැපයුම්කරු ට අවශ්‍ය කාලය මෙම ලේඛයේ අදාළ ආකෘතියේ සඳහන් කළ යුතු ය. |

1. සපයා ඇති අංක Trailer/DW2026 දරණ නිර්මාණ ඇඳීමට (technical drawing) අනුව ට්‍රේලර් නිපදවිය විය යුතු අතර නිෂ්පාදනයේ දී ඇති වන තාක්ෂණික ගැටළු දුරකථන අංක 075-6310846 මගින් යාන්ත්‍රික ඉංජිනේරු අමතා නිරාකරණය කර ගත යුතු ය. A3 ප්‍රමාණයේ කඩදාසියෙහි මුද්‍රිත නිර්මාණ ඇඳීමෙහි පිටපතක් මෙම උපදෙස් සමග ලබා දෙනු ඇත (ලැබී නොමැති නම් කාර්යාලයෙන් විමසන්න).
2. ඉදිරිපත් කරන මිල ගණන් දින 90ක කාලයක් සඳහා වලංගු විය යුතු ය.
3. මෙට්‍රික් ටොන් 5 ක බරක් එසවිය හැකි ධාරිතාවකින් යුත් හයිඩ්‍රොලික් ටිපිං සිලින්ඩර් සවි කළ යුතු ය.ට්‍රේලරයේ පැටවුම් තට්ටුව මිලි මීටර් 5 ඝනකමින් යුතු මෘදු වානේ (යකඩ) තහඩු භාවිතා කර නිපදවිය යුතු ය.
4. ද්විත්ව රෝද සහිත (දෙපස රෝද හතරයි) ට්‍රේලර විය යුතු ය.
5. ට්‍රේලර සඳහා වසර දෙකක වගකීම් කාලයක් ලබා දිය යුතු ය. ටයරයේ සිදු වන සාමාන්‍ය ගෙවීම සහ අනතුරකින් සිදු වන හානි හැර අනෙකුත් සියලු නිෂ්පාදන දෝෂ, පැස්සීම්, හෝස්, හයිඩ්‍රොලික් ජැක්, ජැක් සීල්, බෙයාරිං තහඩු සහ ඇණ කැඩී යාම සම්බන්ධයෙන් මෙම වගකීමෙන් ආවරණය විය යුතු ය. වගකීමට සම්බන්ධ අලුත්වැඩියා ට්‍රේලරය ඇති ස්ථානයට පැමිණ සිදු කළ යුතු ය. ඒ සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවනු නො ලැබේ.
6. නිපදවන ට්‍රේලර් පළාත් පාලන ආයතනය වෙත ප්‍රවාහනය කර භාර දිය යුතු ය. ඒ සඳහා වන ප්‍රවාහන වියදම මිල ලේඛනයට ඇතුළත් කළ යුතු ය.
7. සෑම ට්‍රේලරයකම වැසි අංකයක් තිබිය යුතු අතර, සැපයුම්කරු විසින් මිල ලේඛනයේ සඳහන් කර ඇත. මුදලට අමතර වශයෙන් අය කිරීමකින් තොර ව, ට්‍රේලර් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කර, ලියාපදිංචි කිරීමේ සහතික (Certificate of Registration) හා අංක තහඩු පළාත් පාලන ආයතනය වෙත ලබා දිය යුතු ය. ඒ සඳහා වන වියදම මිල ලේඛනයට ඇතුළත් කළ යුතු ය.
8. මිල ගණන් වලට අදාළ ව රජයට ගෙවන වැට් බදු වෙතොත් ඒවා මිල ගණන් විස්තරයේ වෙන් කර දැක්විය යුතු ය.
9. ඇණවුම නිකුත් කළ දින සිට සති පහක (දින 35ක) කාලයක් තුළ ට්‍රේලර දෙක නිපදවා භාර දිය යුතු ය. සැපයුම සම්පූර්ණ කිරීම සඳහා දින 35කට වඩා කාලයක් අවශ්‍ය නම්, එම අවශ්‍ය කාලසීමාව මිල ගණන් සමග සඳහන් කළ යුතු ය.
10. ට්‍රේලර, ලියාපදිංචි සහතික, සහ අංක තහඩු සැපයීමෙන් පසු, සම්පූර්ණ ගෙවීම එකවර සිදු කළ හැකි ය. අත්තිකාරම් මුදල් අවශ්‍ය නම් ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව එම මුදලට සමාන බැංකු ඇපකරයක් ලබා දිය යුතු වේ.

## II වන කොටස: දත්ත පත්‍රිකාව

| | උපදෙස් |
|---|---|
| **1.1** | ගැනුම්කරු :-.............................................. <br><br> ලිපිනය :- .............................................. |
| **5.1** | මිල උප ලේඛනයේ ඇති (Bill of Quantities) සියලු ම අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතු ය |
| **11.1** | මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වන ලිපිනය - අතුරලිය ප්‍රාදේශීය සභාව, තිබ්බොටුවාව , අකුරැස්ස <br><br> මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය 2026/ දින ප.ව. 2.00 |
| **13** | මිල ගණන් පහත ලිපිනයේ දී විවෘත කරනු ලබයි.: <br><br> අතුරලිය ප්‍රාදේශීය සභාව, තිබ්බොටුවාව , අකුරැස්ස 2026/ දින ප.ව2.30 ට |
| **16.3** | ඇගයීම සඳහා සලකා බැලිය යුතු වෙනත් සාධක: - <br> 1. ආයතනය ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි ආයතනයක් විය යුතු ය (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය) <br> 2. වැට් බද්ද සඳහා ලියාපදිංචි වූ ලංසු කරුවකු නම් වැට් බදු සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ලංසුව සමඟ අමුණා තිබිය යුතු ය. <br> 3. මෙම කාර්ය ඉටු කිරීම සඳහා ලංසු කරුට මෙම කර්මාන්තයේ කටයුතු කර අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබිය යුතු ය (සේවාලාභී ලැයිස්තුව අමුණා තිබිය යුතු ය) |

## III වන කොටස - ලංසු කරු සතු අත්දැකීම

මෙම මිල කැඳවීම හා සමාන ක්ෂේත්‍රවල ලංසු කරු විසින් පසු ගිය වසර 5 තුල ඉටු කල කාර්යය පහත ආකෘතියට අනුව ඉදිරිපත් කරන්න

| | ආයතනයේ නම සහ ලිපිනය | දුරකථන අංකය | ඉටු කරන ලද කාර්යය | මුදල | වර්ෂය |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| 6. | | | | | |
| 7. | | | | | |
| 8. | | | | | |

# IV වන කොටස - මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය

දිනය: .......................

........................................................................................................................................... වෙත

පහත අත්සන් කල අපි මෙසේ ප්‍රකාශ කරමු.:

(a). අප විසින් පරීක්ෂා කර ඇති අතර නිකුත් කරන ලද ලේඛනයට කිසිදු වෙනස් කිරීමක් කර නොමැත;

(b). නිකුත් කරන ලද ලියකියවිලි වල සඳහන් කොන්දේසි වලට අනුකූලව කාර්යය ඉටු කිරීමට අපි ඉදිරිපත් වෙමු.

(C). පිරිනමන ඕනෑම වට්ටමක් ඇතුළුව අපගේ මිල ගණන් වල මුළු මිල: ..................................

........................................................................................................................

(d). ITB උප වගන්තිය 11.1 ට අනුකූලව මිල ගණන් ඉදිරිපත් කිරීමේ කාලසීමාව නියම කර ඇති දින සිට ITB උප වගන්තිය 8.1 හි නිශ්චිතව දක්වා ඇති කාල සීමාව දක්වා අපගේ මිල ගණන් වලංගු වන අතර එම කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර ඕනෑම වේලාවක එය පිළිගැනීමට අප බැඳී සිටී.

(e). මෙම මිල කැඳවීම සහ ඔබ විසින් පිරිනමන ලද දැනුම් දීමේ ඇතුළත් ලිඛිත පිළිගැනීම සමඟ අප අතර බැඳීම් ගිවිසුමක් ඇති බව අපි තේරුම් ගනිමු.

(f). අවම වශයෙන් ඇගයීමට ලක් කළ මිල ගණන් හෝ ඔබට ලැබිය හැකි වෙනත් මිල ගණන් පිළිගැනීමට ඔබ බැඳී නො සිටින බව අපි තේරුම් ගනිමු.

ආයතනයේ නම .......................................................................................................................

ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ..........................................................................................

දුරකථන අංක ......................................................................................................................

නිෂ්පාදන ආයතනයේ ලිපිනය ..........................................................................................

සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබේ නම් ලියාපදිංචි අංකය ................................................

වැට් අදාළ වේ නම් වැට් ලියාපදිංචි අංකය .......................................................................

විද්‍යුත් තැපැල් ලිපිනය ....................................................................................................

මිල ගණන් ඉදිරිපත් කිරීමට බලය ලත් තැනැත්තාගේ නම: ....................................................

සැපයුම සඳහා ගිවිසුම් ගත වීමට බලයලත් අයගේ නම ........................................................

අත්සන: ................................................ දිනය: .................................................

ආයතනයේ නිල මුද්‍රාව:

# V කොටස: පිරිවිතර අවශ්‍යතාව

| | Specification | Requirement | Specifications of the offered item (to be filled by the bidder) |
|---|---|---|---|
| | **Double-wheeled garbage trailer** | | |
| 1. | Equipment type | Trailer capable of transporting municipal waste, fitted with double wheels on both sides. | |
| 2. | Make and model | Please specify | |
| 3. | Manufacturer | Please specify | |
| 4. | Country of Manufacture | Please specify | |
| 5. | Year of Manufacture | Should be 2026 or later | |
| 6. | Condition | Should be new (unused) | |
| 7. | Floor board | 5 mm thick Mild Steel | |
| 8. | Side Panels and Doors | 3 mm thick Mild Steel | |
| 9. | Main Chassis | 6mm thick 8” x 3” MS U-Channels | |
| 10. | Tipping chassis | 6mm thick 5”x2½” MS U-Channels | |
| 11. | Axle | At least 65mm round or square axle made from suitable heavy-duty steel alloy | |
| 12. | Draw Bar | 6 mm thick M.S. Plate | |
| 13. | Towing Eye | 1”-inch thick MS Plate | |
| 14. | Tyres | 750 x 16 size 12 Ply Brand New Tyres with tubes required. Please specify the brand. | |
| 15. | Wheels | Double wheels on either side. Wheel brakes are not required. | |
| 16. | Rims | Lock ring type, 5 Studs. | |
| 17. | Paint for mild steel surfaces | Zinc phosphate primer & marine epoxy paint coating | |
| 18. | Wheel hubs | Brakeless | |
| 19. | Two bearings for each wheel (total 8 bearings) | Provide details of bearing numbers | |
| 20. | Warranty for the complete trailer, wheel hubs, wheel bearings, rims, hydraulic hose, and for manufacturing defects in the tires. | A minimum of a two-year comprehensive warranty is required. Warranty can be exempted for natural tire wear and physical damage caused by severe external impact. | |
| 21. | Capability of providing mobile service (after-sales) | Please give details | |
| | **Accessories** | | |
| 22. | Hitch stand | Required | |
| | **Other information** | | |
| 23. | Validity of price quotation | Submitted prices should be valid for a period of 90 days | |

| | | | |
|---|---|---|---|
| 24. | Transportation and delivery | The purchased trailer should be transported and delivered to the local authority premises by the supplier. Cost of transportation and delivery should be included in the price schedule. No extra charges will be paid | |
| 25. | Registration | Registration of the vehicle with the Department of Motor Traffic in Sri Lanka should be done by the supplier, and licence plates and CR should be submitted before the final payment. Registration charges should be included in the price bid. No extra charges will be paid. | |
| 26. | VAT registration number | | |
| 27. | Time required to manufacture and supply the two trailers | | |
| 28. | Manufacturer contact information | | |
| 29. | Signature and rubber stamp | | |

- Duly filled above information sheet and specification details published by the manufacturer of the offered model should be submitted with the price quotations.
- ඉහත වගුවෙහි සෑම අංගයක් සඳහා ප්‍රමාණවත් තොරතුරු සඳහන් කර නැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## VI කොටස: සපයන පිරිවිතර

ඔබ විසින් නිපදවා සපයන ට්‍රේලරයෙහි ප්‍රධාන පිරිවිතර විස්තර පහත වගුවෙහි සඳහන් කරන්න.

| | | |
|---|---|---|
| 1) | ප්‍රධාන වැසියට යොදා ගන්නා බාර් වල හරස්කඩ ප්‍රමාණය | |
| 2) | එසවෙන රාමුව නිපදවන බාර් වල හරස්කඩ ප්‍රමාණය | |
| 3) | බිම් තහඩුවේ ඝනකම (මිලි මීටර) | |
| 4) | පැති තහඩු සහ දොරවල් තහඩු වල ඝනකම (මිලි මීටර) | |
| 5) | ඇක්සලයේ හරස්කඩ ප්‍රමාණය (මිලි මීටර වලින්, පළල x උස) | |
| 6) | ටිපිං ජැක් එක මගින් එසවිය හැකි උපරිම බර (මෙට්‍රික් ටොන්) | |
| 7) | ජැක් එකෙහි පිටත පරිධිය (වට ප්‍රමාණය) (මිලි මීටර) | |
| 8) | ජැක් එකෙහි වෙළඳ නාමය හා මාදිලි අංකය | |
| 9) | ටයර වල ප්‍රමාණය | |
| 10) | ටයර වල වෙළඳ නාමය හා මාදිලි අංකය | |
| 11) | පින්තාරුව සඳහා යොදා ගන්නා ප්‍රයිමර් වල වෙළඳ නාමය හා මාදිලිය | |

| | | |
|---|---|---|
| 12) | පින්තාරුව සඳහා යොදා ගන්නා තීන්ත වල වෙළඳ නාමය හා මාදිලිය | |
| 13) | හෝස් එකෙහි පීඩන ධාරිතාව (psi) | |
| 14) | හෝස් එකෙහි ply (පොටවල්) ගණන | |
| 15) | රෝද බෙයාරිං අංක | |
| 16) | පැටවුම් තට්ටුවෙහි පැති තහඩු වල උස (අඟල්) | |
| 17) | මිල ගණන් වලංගු කාලය | |
| 18) | ට්‍රේලර් එකක් නිපදවීමට අවශ්‍ය කාලය | |
| 19) | ලබා දෙන වගකීම් කාලය | |
| 20) | Trailer/DW/2026 නිර්මාණ ඇඳීමට අනුව නිපදවීමට එකඟතාව (ප්‍රධාන වෙනස්කම් තිබේ නම් එම විස්තර මෙහි සඳහන් කළ හැකි ය) | |

සැපයුමට අදාළ වන වෙනත් පිරිවිතර තොරතුරු වේ නම් මෙහි අමුණන්න / සඳහන් කරන්න.

# VII කොටස: මිල ගණන් ලේඛනය (ශ්‍රී ලංකා රුපියල්)

| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |
|---|---|---|---|---|---|---|---|
| | අයිතම විස්තරය | ප්‍රමාණය | (වැට් හැර අනෙකුත් සියලු බදු ඇතුළත්) ඒකක මිල | වට්ටම් අඩු කළ පසු ඒකක මිල | අයිතමය සඳහා මිල (තීරු 3 x 5) | වැට් බද්ද | වැට් බදු සහිත විකුණුම් මිල (තීරු 6+7) |
| 1. | ඉහත දක්වා ඇති පිරිවිතර අනුව නිපදවන ලද ට්‍රේලර | 2 | | | | | |
| 2. | රථ ලියාපදිංචි කර, ලියාපදිංචි ලේඛනය සහ අංක තහඩු සැපයීම | 2 | | | | | |
| 3. | අතුරලිය සභාව වෙත ප්‍රවාහනය කර භාර දීම සඳහා වන ප්‍රවාහන ගාස්තු, එසවීමේ / පැටවීමේ / බෑමේ ගාස්තු, සහ දේශීය ප්‍රවාහනයට අදාළ වන රක්ෂණ වියදම් ආදිය. | 2 | | | | | |
| | එකතුව | | | | | | |

වැට් ඇතුළත් නොවන මිල එකතුව (අකුරෙන්): ..............................................................................................................................................................................................

මිල ගණන වලංගු කාලය .............................. ලංසු කරුගේ අත්සන ..................................................... දිනය ...................................

ආයතනයේ මුද්‍රාව :

## VIII කොටස: සැපයීමේ කාල රාමුව

| | සැපයිය යුතු භාණ්ඩය / සම්පූර්ණ කළ යුතු කාර්යය | සැපයීම සිදු කළ යුතු සහ කාර්යය ඉටු කළ යුතු ස්ථානය | භාණ්ඩ ඇණවුමේ දින සිට සැපයීමට අවශ්‍ය කාලය දින වලින් | |
|---|---|---|---|---|
| | | | ගැනුම්කරු ගේ අවශ්‍යතාව | සැපයුම්කරු ගේ එකඟතාව හෝ අවශ්‍ය දින ගණන (සැපයුම්කරු විසින් පිරවිය යුතු ය) |
| 1. | පිරිවිතර අනුව නිපදවන ලද ට්‍රේලර සැපයීම | අතුරලිය ප්‍රාදේශීය සභාව | | |
| 2. | ලියාපදිංචි සහතිකය සහ අංක තහඩු භාර දීම | | | |
| 3. | සපයන ලද භාණ්ඩවල මනා තත්වය ක්‍රියාත්මක කර පෙන්වා භාර දීම | | දින 35 | |